# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 දෙසැම්බර් මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.01.04 දින නිකුත් කරන ලදී)**

# සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)

**2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00     තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා වන පිරිවැටුමේ සීමාව, 2024 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන එකසිය විස්සේ සිට රුපියල් මිලියන හැට දක්වා අඩු කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 4 වන වගන්තියට කළ සංශෝධනයන්ට ආනුෂංගික වේ.

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු
(සංශෝධන)

එල්.ඩී.-ඕ. 70/2023

### 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක      දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2022 අංක 25 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා, (අ) ඡේදය අදාළ නොවන්නා වූ බදු අයකළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, යම් කාර්තුවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන තිහක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට දින පහළොවකට වඩා පසු නොවී;"; සහ

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඇ) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, යම් කාර්තුවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන පහළොවක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට හෝ අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන හැටක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට දින පහළොවකට වඩා පසු නොවී,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයේ "අවසන් කර ඇති අවස්ථාවක දී; හෝ" යන වචන වෙනුවට, "අවසන් කර ඇති අවස්ථාවක දී;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) ඡේදයේ "අදාළ කාර්තුවට පෙරාතුව ම වූ එක් එක් කාර්තු හතර තුළ දී රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී," යන වචන වෙනුවට, "2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අදාළ කාර්තුවට පෙරාතුව ම වූ එක් එක් කාර්තු හතර තුළ දී රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී; හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඇ) ඒ තැනැත්තාගේ සමස්ත පිරිවැටුම 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන හැටක් නොඉක්මවන අවස්ථාවක දී," යන වචන ආදේශ කිරීමෙන්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.